

# ඒවන් උතුම් සෙබළ පුතුන්

රණබිමේ ජීවතුන් අතර සිටින සෙබළුන් මෙන්ම මේ බිමේ අඩි හයක් යටින් සදාකල් නිදන සියළුම සෙබළුන්ද මේ ජයග්‍රහණයේ කොටස්කරුවන් බව අපි ලියා තබමු. යුද්ධය ගැන කයිවාරු ගහන දේශපාලනඥයෝද සිටිති. යුද පෙරහැරේ නිළමෙලාට අඳින අයද සිටිති. නමුත් සැබෑ සටන්කරුවා අර සෙබළා ය.

අප බුහුමන් කළ යුත්තේ සෙබළාට පමණක් නොවේ. ඔහු යුද භූමියට පරිත්‍යාග කළ මවට, පියාට, බිරිඳට, දරුවාට, සොයුරාට සොයුරියට ද අප බුහුමන් පුද කළ යුතුය. ඔවුන්ගේ ජීවිත පරිත්‍යාගයෙන් අප ලබාගත්තේ භූමිය පමණක් නොවේ. අපට අපේ ජාතිකාභිමානයද, අපේ නිවහල්භාවයද ලබා දෙන ලද්දේ ඔහු විසිනි.

තිස් වසරක එල්ටීටීඊ භූමිකාව අවසන්ව තිබේ. මෙය යුද්ධයෙන් දිනිය නොහැකි එකක් යයි ඇතැම්හු කීහ. එසේ කී වැඩිදෙනා දේශපාලනඥයෝ වෙති. අනෙක් පිරිස චක්‍රාකාරයෙන් කොටි සංවිධානයෙන් සල්ලි ගත් එන්ජීඕ ගැති සිංහලයන්ය. ඒ සිංහළ ද්‍රෝහීන් අතර මහාචාර්යවරුද වෙති. තමා සිංහළයෙකැයි හඳුන්වාගැනීම ලැජ්ජාවට කරුණකැයි සිතූ ජාත්‍යන්තරවාදීහු සිටියහ. ශුද්ධවූ ආර්ය සිංහළයන් නැතැයි ඔව්හු කීහ. ඒ කොටි සල්ලි නිසාය. එජාප රජය යුද්ධය සම්බන්ධයෙන් කළදෑ කීදෑ නැවත කිවයුතු නැත. වරෙක යුද්ධ කරන්නැයි කියා, ඊළඟ දවසේ යුද්ධය නවත්වන් නැයි ඔව්හු සෙබළුන්ට කීහ. ඒ අතර තුර සෙබළ ජීවිත රාශියක් අහිමි වී ගියේය. ශ්‍රී ලංකා සෙබළා යුද්ධ කරන්නේ පඩියට මිස රටට ආදරයක් ඇති නිසා නොවේයයි කී අයද සිටියහ. නමුත් අද වනවිට ශ්‍රීලංකා හමුදා සෙබළා තරම් බහුමානයට පත්වන අන් කෙනෙකු නැති තරම්ය. සැබෑ වින්ම ඒ ගෞරවය ඔහුට හිමිවිය යුතුය.

මේ ගතවූ 30 වසර තුළ ඊළාම් යුද්ධයට එරෙහිව යුදබිමට ගොස් මියගිය පාබල, ගුවන් සහ නාවුක හමුදා සෙබළුන්ගේ නම් ලැයිස්තුවක් නම් අප ළඟ නැත. නමුත් මියගිය ගණන අතිවිශාල බව නම් සිකුරුය. සෙබළාගේ වටිනාකම තිබෙන්නේ ඔහුට වෙන්වූ අංකය හෝ නම තුළ නොවේ. ඔහු කළ ජීවිත පූජාව තුළය.

ඇතැම් සෙබළෙක් දහඅට හැවිරිදි වියට ළං වුණා පමණි. යුද්ධයට ඔහු පිවිසි පළමු සටනේදීම ඔහුට මිය යන්නට සිදුවේ. ඇතැම් සෙබළෙක් විවාහවූවා පමණි. සිය දරුවා බිරිඳගේ කුස තුළ සිටියදීම ඔහු යුද භූමියේ අවසන් හුස්ම හෙළයි. තවත් සෙබළෙක් සිය බිරිඳ දරුවා බිහිකොට සිටියදී උපන් දරුවාගේ මුහුණ දකින්නට එන්න පෙරාතුව යුදබිමේදී මිය යයි.

තවත් සෙබළෙක් ඊළඟ නිවාඩුවට ආවිට කසාද බඳිමුයයි පෙම්වතියට පොරොන්දුවී යුද පිටියට යයි. නමුත් පොරොන්දු ඉටුකරන්නට ආපසු ගමට එන්නට ඔහුට ඉඩ නොලැබේ. මේ තිස් වසර තුළ කොටින්ට ඊළාම් සිහියම සම්පූර්ණ කරගන්නට නොහැකි වූයේ එලෙස යුදපිටියේ ජීවිතය පිදූ සෙබළ සමූහයා නිසාය.

අප නිදහසේ කොළඹ ගමන් බිමන් ගියේ ඔවුන් සුපරීක්ෂාකාරීව රාජකාරියේ යෙදී සිටි නිසාය. අප රාත්‍රි සංගීත සංදර්ශණ බලමින් විනෝදවූයේ ඔවුන් පාරවල්වල බරැති තුවක්කු ඔසවාගෙන රැකවල් ලාගෙන සිටි නිසාය.

ඔවුන්ට අපට මෙන් සුවදායක ජීවිතයක් තිබුණේ නැත. බර සපත්තු, හිසෙහි වූ ගල්තොප්පි, බෝම්බ පිරවූ ජැකට්ට් ඇඳුම් සමග සති ගණන් ඔව්හු ජීවත්වූහ. මහා වැසි මැද්දේ දිය පහරවල් ඇළ දොළවල් හරහා ගමන්කිරීම ඔවුන්ගේ සාමාන්‍ය ජීවිතයේ අංගබවට පත්වමින් තිබිණ.

ඒ සියල්ලටම වඩා සතුරාට මුහුණදීම භයංකරම කරුණවිය. එක්කෝ ජීවිතය. නැත්නම් මරණය. එසේත් නැත්නම් සදාකාලික අංගවිකල භාවය ය. සදහටම ඇස් අන්ධ වූ සෙබළු කොපමණ සිටිත්ද? ඇතැම් විට පා දෙකම අහිමි වූ අය කොතෙක්ද? අත්වල ඇඟිලි දහයම අහිමි වූ තරුණ සෙබළු කොතෙක්ද? එමෙන්ම මිනී පෙට්ටියකින් හෝ ගෙදර එන්නට නොලද, කොහේ කොතනදැයි නොදැක අතුරුදහන් වූ තරුණ සෙබළු කොතෙක්ද? ඒ සියළු දෙනම මේ විජයග්‍රහණයේ කොටස්කරුවෝ වෙති.

යුද ජයග්‍රහණයෙන් ජය පැන් බොන්නන් බොහෝය. කැපී පෙනෙන්නේ, කැමරාවලට පෙනී සිටින්නේ ඔවුන්ය. නමුත් මියගිය සෙබළෙකුගේ නමක් මතකදැයි ඇසුවහොත් ඔව්හු නොදනිති. සෙබළාගේ උරුමය එයයි. ඔහුට නමක් නැත. එහෙත් අන් කිසිවෙකුටත් වඩා අභිමානයක් සහ ගෞරවයක් ඔහුට තිබේ. මක්නිසාද ඔහු මියගියේ අප රට මුදා ගැනීමේ සංග්‍රාමයට දායක වෙමිනි. අවසන ලද ජයග්‍රහණයේ කොටස්කරුවෙකු වෙමිනි. සැබෑ සෙබළා රණවිරුවාය යන ගෞරව නාමයෙන් පැසසුම් සහ ගරු බුහුමන් ලබමින් ජනතාවගේ හදවත්හි චිරාත් කාලයක් ජීවත්වෙනවා ඇත.

♦ **චන්ද්‍රසිරි දොඩන්ගොඩ**
දිවයින කතෘ මණ්ඩලය





## විරු ඔබටයි මේ තුති ගී!

පරසතුරන් එකතුවෙලා මගෙ මව් රට විසුණු කළා
කැලි කැලි දෙකට කඩාගන්න සිතාලා
මුතු ඇට මෙන් එකතුවෙලා මව්බිම රැකගන්න කියා
තරුණන් යුහුසුළු වූයේ දිරිය වඩාලා
බිළිඳුන් නළවන දෑතට ගනිමින් ගිනි අවි ආයුධ
තරුණියො කඳවුරු මායිම දෑස යොමාලා
දිවිදී රට රැකි ඒ දරුවන් ලෙය මිහි මත ගැලීය
කෙලෙසක දෙන්නද අප රට දෙකට කඩාලා

සිහළ දෙමළ ලෙස වෙන්කර ජාතිවාදෙ ඇවිලී විත්
දින දින ලක්මවගෙ දරුවො මරු වෙත යැව්වා
එක එක රජවරු එනවා පොරොන්දු වැසි වස්සනවා
කොටියා හරි බරි ගැහිලා තව තර වූවා
විර පුතුන් රට රකින්න ආවත් යුද්දෙට බැඳිලා
සාමයෙ කසුකුසු අතරේ උන් හිර වූවා
කොටියා රට වනසනවා ලොක්කන් සාමය දෙනවා
සිංහළයා දිනෙන් දිනම පිරිහී ආවා

වීර පුරන් අප්පු වගේ ගජබා මහ නිරිඳු වගේ
රජෙකුගෙ වටිනාකම අප දැයට වැටහුණා
චෝර දමිළ රුපු නසනට වීර බසින් දැය කළඹන
රට දැය රැක්මට කැපවුණ රජෙක් බිහිවුණා
සත්‍යය ලොවටම පෙන්වා කොටියගෙ වෙස් බිඳදැම්මා
ලොව වට රටවල් තුස්නිම්භූතව උන්නා
මහබල ගණදෙවි නුවණින් සෙබළුන් නිසිමග යොදමින්
සෙන්පතිවරු ඉදිරියටම පියවර මැන්නා

මහ කොටියට තරුපෙන්නා යනඑන මං නැතිකරලා
ඔහු කළ පව් පල දී මරුවා අම තන්නා
රණවිරුවන් ලක්මැණිගෙ දිවරැ නිදි නොලබා සිට
අසරණ වූ දෙමළ දනා මුදවා ගන්නා
ඒ මේ අත පනිමින්නා ගස්ගල් යට සැඟවෙන්නා
කොටි දෙටුවන්ගේ ඊළම් හීනෙ බිඳෙන්නා
ලක්මැණිගෙ විරු දරුවෝ කොටියා පස්කර දැමුවෝ
මුළු සිරිලක් දේසෙ පුරා කිරි ඉතිරෙන්නා

දැයේ උතුම් විරු දරුවනි දැහිතකාමී මැතිඳුනි
ඔබ සැම ඉදිරියෙ අප සැම දණ නම මින්නේ
යෝධ බලය හා ශක්තිය දින දින වැඩිවී සැමහට
සාමය සෞභාග්‍යය රට තුළ කැඳ වන්නේ
එකම සිංහධජ සෙවනේ එක්ව වෙසෙන ලක්දරුවන්
මතු ඉතිහාසේ ඔබ නම රනින් දිලෙන්නේ
සිංහ රජිඳු හා විරුවනි ඔබහට උපහාර පිණිස
ජයගොස තුති ගී මේ ලෙස අප හඬ වන්නේ

♦ **සීතා කුමාරි** (ඉබ්බාගමුව පන්නල)
Limassol Cyprus

## නිර්මාණ Nirmana

### සාමය උදාවුණා

වෙන්වී වසර ගණනක් තිබු අතී තෙට
යා කරලුවා මව්බිම එක කොඩිය යට
නැගම් යන්න උතුරට දැන් දකුණෙ සිට
සාමය උදා වූවා අපෙ ලක් බිමට

වෙඩි හඬ අභිබවා පතුරා සිංහ නද
විරුවන් අපෙ ගියේ පෙරමුණ කඩොලු බිඳ
ඊළම් සිහින සිඳ බිඳ එසවුණා දද
හසරැල් නැගෙනවා හැමගේ මුවින් අද

කොටි හිතවතුන්ගේ මැසිවිලි නිමක් නැත
පැවත් විරෝදය ලෝකයෙ සතර අත
පසුබට නොවී එඩිතර කර ඔහුගෙ සිත
සෙන්පතිතුමා තැබුවා යුද්ධයට තිත

සාමය බිඳ හෙලා වෛරයෙ ගිනි දැල්වූ
ජීවිත දහස් ගනනක් අඳුරේ ගිල්වූ
විරුවන් හමුවෙ පැරදී අන්තෙට පල්වූ
බිහිසුණු ගරිල්ලන් ලෙස නම ලොව හෙල්වූ

රවටාගෙන ලොවම මඩිතර කර ගන්න
තම ජාතියම මර මර පාවා දුන්න
කඳ බඩ එළියෙ හිස සඟවා නොපෙ නෙන්න
බියගුළු නිවටයෙකි නුඹ සැඟවී උන්න

රණවිරු සෙබළ කැළ දැක මරබිය සිතට
දැනුනෙන් සිතුවෙ එතනින් පැන දුව ගන්ට
එය වැළකෙමින් විය කළ පව් පල දෙන්ට
දොරටුව ඇරුණි විගසින් පරලොව යන්ට

♦ **විමලා යාපා (ඇඹිලිපිටිය)**
Cyprus

### කිතුගොස

දෙස බස රැසට තිස් වසරක් කැටුව වින
විසඳා කොටි පැනය ජයසක් පිඹින දින
එසවෙන විටදි හෙළ දද රට සතර කොණ
දස අත නැගෙන කිතුගොස සම්පතද මොන

බිය සැක සමග පොර බැදූ මූසල යුගය
දියවී ගියා අද රට දැය අප ළඟය
මෙය ඉතිහාසයෙන් හෙළ විරු ගත් මගය
දියලුම හුරතල්ය ඒවාගෙම දහය

ජය ලද පසුව එහි නිසි පළ නෙලීමට
සියළුම දනන් එක මඟකට ගැනීමට
ණය නැති රටක් හෙට දින ගොඩ නැගීමට
පියවර අවැසි වී ඇත අද තැබීමට

පැවතුණ මතවාද ජය හමුවේ සුන්ව
ගැවසුණු රුදු අඳුර ඇත අද අවසන්ව
නිවටුන් ලෙස නොසිට හෙට දවසෙදි වෙන්ව
අවදිව බලව් එක මවකගෙ දරුවන්ව

♦ **තල්ගම්පල ගුණසේන**
Sri Lanka

### අමතක නොකරමු අප රණවිරුවන්!

උතුරු නැගණහිර කොටි රැළ වනසා
සහනය ආවා සැම සිත් සනසා
ඒ දුක් යළි නොඑනට කිසි විලසා
පාඩම් ගමු ඉතිහාසෙන් විමසා

ජනපති ඇතුළුව නායක යන්නේ
මග පෙන්වීමෙන් නිසිමග දන්නේ
අවතැන් වූවන්ගේ අත ගන්නේ
කුළුණු සිතැති රණ විරුවන් වන්නේ

රැයක් දවාලක් ඔවුනට නැත්තේ
කෑමට බීමට කාලය නැත්තේ
නෙතු දල්වා සිටියේ කොටි මත්තේ
එහෙමයි රණවිරු ජීවිත සත්තේ

මියැදුණු වික්මැති විරු දරු වන්නේ
පුද දුන් ජීවිත පිවිතුරු වන්නේ
එනිසයි දේශය අදත් රැකෙන්නේ
ඒ පින සුළු පින කැයි නොසිතන්නේ

දැතින් ගෙන මානාගෙන අවිය
සිරුරේ තිබෙනා යෞවන සවිය
ඔහු සිත තුළ පැවතුණ ඒ එඩිය
අප හට අමතක වන්නට බැරිය

රණවිරුවන් කළ මෙහෙවර සැමදා
අප හදවත් තුළ ගනු මැන රන්දා
අප රට බේරුණේ ඒ අය හන්දා
උපහාරය පුදකරලමු කැන්දා

විරුවන් බිහි කළ රණවිරු අම්මා
දරු පෙම නොමැතිය වන්නේ නිම්මා
රට දැය වෙත දරුවෙකු දුන් අම්මා
ගෙදර බුදුන් ඇය මතු බුදු වෙම්මා

♦ **කමණී නිරෝෂිණී**
Cyprus